**ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල ප්‍රජා ජීවනෝපායයන් පිළිබඳ ව්‍යාපෘතියේ (යළි පිබිදෙන ව්‍යාපෘතිය) 2014**

---

ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල ප්‍රජා ජීවනෝපායයන් පිළිබඳ ව්‍යාපෘතියේ (යළි පිබිදෙන ව්‍යාපෘතිය) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2004 ජූලි 23 දින එළඹි අංක 3935 සීඊ දරන සංවර්ධන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.01 (ආ) (i) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පසුව, මෙම ව්‍යාපෘතියට අතිරේක මූල්‍යයනය සැපයීම සඳහා ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2010 ජනවාරි 11 දින අංක 4671 එල්කේ දරන දෙවැනි මූල්‍යයන ගිවිසුමට හා 2011 නොවැම්බර් 29 දින අංක 4956 එල්කේ දරන තෙවන මූල්‍යයන ගිවිසුමට එළඹ තිබුණි.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ මූල්‍යයන ගිවිසුම්වලට අනුව, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රතිපත්ති සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. තිරසාර සමාජයීය හා ආර්ථික ප්‍රතිසංකලනය සඳහා ජීවනෝපායයන් ප්‍රතිස්ථාපනය කිරීම, කෘෂිකාර්මික හා වෙනත් නිෂ්පාදන සහ ආදායම හා ධාරිතා වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා උතුරු හා නැගෙනහිර පළාත්වල සහ තදාසන්න ප්‍රදේශවල ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රජාව සඳහා ආධාර කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,844.42 කට සමාන එජඩො මිලියන141.14 ක් වන අතර ඉන් එජඩො මිලියන 124.70 ක් මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ශ්‍රී ලංකා රජයේ සහ ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ගේ දායකය පිළිවෙලින් එජඩො මිලියන 13.72 ක් හා එජඩො මිලියන 2.72 ක් විය. 2004 ජූලි 23 දින ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලද අතර 2014 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම

පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම, ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම
-----------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන
----------------

2.1 මතය
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැරුණු විට මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
-----------------------------------------

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------------

මූල්‍ය ප්‍රකාශනවල අංක 4956 දරන මූල්‍ය ගිවිසුම යටතේ දැක්වෙන රු.5,460,207,471 ක් හා රු.224,750,491 ක් වූ පිළිවෙලින් සිවිල් වැඩ වටිනාකම හා ප්‍රදාන වටිනාකම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද උපයෝගී වාර්තාවල දැක්වෙන රු.5,746,327,659 ක් හා රු.254,932,535 ක් වූ මුදල් සමඟ ගැලපී නොතිබුණි.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය
-------------------------------------

3.1 අරමුදල් උපයෝජනය
--------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම්වලට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | **2014** දෙසැම්බර් **31** දක්වා | |
| | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන | එ.ජ.ඩො මිලියන | රු.මිලියන |
| ජාසංස | | | | | | | |
| ගිවිසුම් අංකය | | | | | | | |
| 3935 | 64.70 | 8,217.44 | 480.00 | 3.63 | 476.10 | 57.96 | 7,593.96 |
| 4671 | 12.00 | 1,400.28 | 24.00 | 0.18 | 23.56 | 10.32 | 1,352.29 |
| 4956 | 48.00 | 5,582.70 | 976.00 | 7.45 | 975.89 | 43.60 | 5,711.97 |
| ප්‍රතිලාභීන් | 13.72 | 1,372.00 | - | - | - | - | 153.35 |
| ශ්‍රී ලං ර | 2.72 | 272.00 | 131.00 | - | 131.19 | - | 1,606.22 |
| එකතුව | 141.14 | 16,844.42 | 1,611.00 | 11.26 | 1,606.74 | 111.88 | 16,417.79 |

සංරචක 09 ක් සඳහා සියයට 9 සිට සියයට 75 දක්වා වෙන්කිරීම් වැඩිකිරීම මඟින් හා වෙනත් සංරචක 03 ක් සඳහා සියයට 31 සිට සියයට 83 දක්වා වෙන්කිරීම් අඩුකිරීම මඟින් සාමාන්‍ය ලක්ෂණයක් ලෙස ව්‍යාපෘතියේ සංරචක සඳහා මූල්‍ය ගිවිසුම් මඟින් වෙන්කරන ලද අරමුදල් නිරතුරුව වෙනස් කර තිබුණි. එබැවින් එක් එක් සංරචකය යටතේ සිදුකිරීම සඳහා සැලසුම් කරන ලද භෞතික කාර්යයන්ද වෙනස් කර තිබූ බව නිරීක්ෂණය විය. එබැවින් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයේදී මූල්‍ය හා භෞතික කාර්යසාධනය ඉටුකර ගැනීම් සැකසහිත බව විගණනයේදී බැහැර කළ නොහැක.

3.2 භෞතික ප්‍රගතිය

--------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ව්‍යාපෘති ප්‍රගති වාර්තාව අනුව, ගම් පුනරුත්ථාපනය හා සංවර්ධනය පිළිබඳ සංරචකය යටතේ සමාලෝචිත වර්ෂය තුළ සිදුකිරීමට අපේක්ෂා කරන ලද කාර්යයන් හා 2014 දෙසැම්බර් 31 දක්වා සම්පූර්ණ කරන ලද කාර්යයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| කාර්යයන් | සම්පූර්ණ කළයුතු කාර්යයන් සංඛ්‍යාව | | 2014 දෙසැම්බර් 31 දක්වා සම්පූර්ණ කරන ලද කාර්යයන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | පළමු මූල්‍යයන ගිවිසුම | දෙවන මූල්‍යයන ගිවිසුම | පළමු මූල්‍යයන ගිවිසුම | දෙවන මූල්‍යයන ගිවිසුම |
| ධාරිතා වර්ධනය | 119,973 | 30,787 | 75,284 | 25,765 |
| යටිතල සංවර්ධනය | 2,411 | 1,023 | 2,363 | 1,070 |
| ජීවනෝපාය සහාය සඳහා උප ණය | 118,168 | 23,613 | 108,011 | 22,610 |

තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත තොරතුරු අනුව, 2014 දෙසැම්බර් 31 දිනට සෑම කාර්යයක් යටතේම භෞතික ප්‍රගතිය ඉලක්කයට වඩා පිටුපසින් පවතින බව අනාවරණය විය. ඉලක්කයන් තාවකාලික පදනම මත සිදුකරන ලද බවත්, ව්‍යාපාර යෝජනා පිළිබඳ ශක්‍යතාවය මඟින් උප ණය සැපයීම සඳහා තථ්‍ය ප්‍රතිලාභීන් තෝරාගත් බවත් මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා පැහැදිලි කර තිබුණි.

(ii) ව්‍යාපෘතියේ ප්‍රජා මෙහෙයුම් අත්පොත අනුව, ගම් පුනරුත්ථාපන කාර්යයන් සඳහා වෙන් කරන ලද මුළු අරමුදල්වලින් සියයට 10 ක්, සියයට 50 ක් හා සියයට 40 ක් ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා පිළිවෙලින් ධාරිතා වර්ධනය, යටිතල සංවර්ධන කාර්යයන් හා ජීවනෝපාය සහාය කාර්යයන්වලට උප ණය සඳහා උපයෝජනය කළ යුතුය. කෙසේ වුවද 2014 දෙසැම්බර් 31 දිනට එක් එක් වර්ගය යටතේ තථ්‍ය අරමුදල් උපයෝජනය පිළිවෙලින් සියයට 6.24 ක්, සියයට 30.41 ක් හා සියයට 63.36 ක් විය.

(ආ) ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද පොකුරු මට්ටමේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන පිළිබඳ සංරචකය යටතේ ඉලක්ක කරන ලද කාර්යයන් 114 කින් කාර්යයන් 69 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දින වන විට ඒ සඳහා රු.මිලියන 258.03 ක් වැය කර තිබුණු බව නිරීක්ෂණය විය. ඉහත කාර්යයන් 69 න් රු.මිලියන 9.57 ක පිරිවැයකට ක්‍රියාත්මක කරන ලද කාර්යයන් 10 ක් අත්හැර දමා තිබුණි. වෙනත් කාර්යයන් 28 ක මෙහෙයුම් රු.මිලියන 32.62 ක් දැරීමෙන් පසුවද අදාළ ප්‍රජා සංවිධාන සමඟ අවිධිමත් සම්බන්ධීකරණය හේතුවෙන් ප්‍රතිලාභීන් විසින් සතුටුදායක ලෙස සිදුකර නොතිබුණි. තවද මෙම වැඩසටහන යටතේ පවුල් ආර්ථිකය වැඩිදියුණු කිරීමේ පැකේජ පිළිබඳ කාර්යයන් 19 ක් සඳහා රු.මිලියන 9.63 ක මුදලක් ව්‍යාපෘතිය විසින් වැයකර තිබුණද නියාමනය හා විධිමත්

අධීක්ෂණය නොමැතිවීම හේතුවෙන් ඒ සඳහා වූ ජනතාව සඳහා අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) වගාකිරීම පිළිබඳ දැනුවත්භාවය වැඩිකිරීම හා ඔවුන්ගේ නිෂ්පාදනවලට අගය එකතු කිරීමක් ලබා දීම මඟින් කළු කඩල (Black Gram) ගොවීන්ගේ ආදායම වැඩිදියුණු කිරීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ කුඹුක්වැව ගමෙහි කළු කඩල සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කර තිබුණි. ගබඩා පහසුකම්වලින් යුතු කළු කඩල සකස්කිරීමේ මධ්‍යස්ථානයක් රු.මිලියන 5.4 ක පිරිවැයකට ව්‍යාපෘතිය විසින් ඉදිකර තිබුණද, පුහුණු වැඩසටහන් පැවැත්වීම, ගොවීන් ලියාපදිංචි කිරීම හා ගැණුම්කරුවන් සමඟ ඉදිරි විකුණුම් ගිවිසුම් අත්සන් කිරීම ආදී අනෙකුත් කාර්යයන් සිදු නොකිරීම හේතුවෙන් වැඩසටහනේ අරමුණු ඉටුකර ගත නොහැකිව තිබුණි. තවද 2012 පෙබරවාරි 24 දින රු.65,000 ක පිරිවැයකට මිලදීගත් “ඩිහල්ටර් යන්ත්‍රය” (Dehulter Machine) ප්‍රසම්පාදනය කරන ලද දිනයේ සිට නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) තරුණයින් 60 දෙනෙකු සඳහා රැකියා අවස්ථාවන් ලබා දීමට හැකිවන පරිදි ග්‍රාම සංවර්ධන සංවිධාන 02 ක සහභාගීත්වය සහිතව පුත්තලම දිස්ත්‍රික්කයේ පරිසර හිතකාමී අතින් නිපදවන කඩදාසි නිෂ්පාදන වැඩසටහනක් ස්ථාපිත කිරීම සඳහා ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණි. රු.මිලියන 11.90 ක් වූ ඇස්තමේන්තුගත පිරිවැයෙන් මෙම කාර්යය සඳහා රු.මිලියන 6.14 ක් සැපයීමට ව්‍යාපෘතිය එකඟ වී තිබුණි. ලැබුණු තොරතුරු අනුව, 2013 ජනවාරි මාසයේදී ආරම්භ කර තිබූ වැඩසටහන් කාර්යයන් අරමුදල් සැපයීමේ ප්‍රමාදයන්, නිෂ්පාදන අලෙවි කිරීමේ ගැටලු හා වෙළඳපොළ පර්යේෂණ නොමැතිවීම ආදී කරුණු කිහිපයක් හේතුවෙන් 2013 ජූලි මාසයේදී නවතා දමා තිබුණි.

(ඉ) ව්‍යාපෘතිය යටතේ 2014 දෙසැම්බර් 31 දක්වා පුනරුත්ථාපනය කිරීම සඳහා අපේක්ෂා කළ ගම්වල ජලාශ 144 කින් ජලාශ 141 ක් පමණක් එදිනට පුනරුත්ථාපනය කර තිබුණි.

(ඊ) තවද ජීවනෝපාය ප්‍රතිස්ථාපනය කිරීමේ සංරචකය යටතේ පොලි නෙට් නිවාස 3,026 ක් ඉදිකිරීම සඳහා අපේක්ෂා කර තිබුණද, පොලි නෙට් නිවාස සැලසුම් කිරීමේ අඩුපාඩු හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දක්වා පොලි නෙට් නිවාස 1,229 ක් පමණක් ඉදිකර තිබුණි.

(උ) පළමු මූල්‍යායන ගිවිසුම යටතේ 2005 සිට 2008 දක්වා කාල පරිච්ඡේදය සඳහා කේන්ද්‍රීය ගම් 237 ක ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමයක් ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කර තිබූ අතර ප්‍රතිලාභීන් 8,935 ක් සඳහා උප ණය වශයෙන් රු.මිලියන 183 ක මුදලක් ලබා දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 සැප්තැම්බර් මාසයේ සිට හිඟ උප ණය ශේෂයන් සම්බන්ධයෙන් තොරතුරු ව්‍යාපෘතිය විසින් යාවත්කාලීන කර නොතිබූ බැවින් 2014 දෙසැම්බර් 31 දිනට හිඟ උප ණය ශේෂයන් පිළිබඳ විස්තර විගණනයට

ඉදිරිපත් කර නොතිබුණි. තවද 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාර්යයන් වසා දැමීමට සැලසුම් කර තිබියදී අදාළ ප්‍රාදේශිය ලේකම් කාර්යාල සමඟ අවශ්‍ය තොරතුරු ව්‍යාපෘතිය විසින් සන්නිවේදනය කර නොතිබුණු අතර ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් උප ණය නියාමනය කිරීමේ කාර්යය සඳහා 2012 වර්ෂයේදී සංවර්ධනය කරන ලද පරිගණක මෘදුකාංගයද අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට භාරදී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ක්ෂුද්‍ර මූල්‍යයන යෝජනා ක්‍රමයේ තිරසාර ක්‍රියාත්මකවීම් උදෙසා උප ණය ශේෂයන් අයකර ගැනීමේ හැකියාව සහ අරමුදල් චක්‍රීකරණය වීමේ හැකියාව විගණනයේදී ප්‍රශ්නගතව පැවතුණි.

(ii) නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලවල රු.මිලියන 12.2 ක් වූ අතැති මුදල් ශේෂයන් හා දිස්ත්‍රික්ක 09 ක බැංකුවල රු.මිලියන 219.1 ක ශේෂයන් 2014 සැප්තැම්බර් 30 දිනට පැවති බව නිරීක්ෂණය විය.

(iii) උප ණය මුදල් සාවද්‍ය පරිහරණය සඳහා අවස්ථා ඇති කරමින් ප්‍රතිලාභීන් විසින් උපයෝජනය කළ උප ණය මුදල් ලබාදීමේ අරමුණු නියාමනය හා අධීක්ෂණය කිරීමට 2008 වර්ෂයේ සිට ව්‍යාපෘතිය විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(iv) වවුනියා, මන්නාරම, යාපනය, කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන්ට ලබා දුන් උප ණය සඳහා මූල්‍ය ප්‍රකාශනවල සියයට 20 ට වැඩි ප්‍රමාණයකින් බොල් ණය සඳහා ප්‍රතිපාදනය කර තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් නිකුත් කරන ලද උපදෙස් අනුව, පොලි නෙට් නිවාස අත් කරගැනීම සඳහා සුදුසු සැපයුම්කරුවකු තෝරා ගැනීමට දිස්ත්‍රික් මට්ටමින් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විසින් ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කළ යුතුය. සියලු දිස්ත්‍රික්ක 10 සඳහා පොලි නෙට් නිවාස 428 ක් සපයා ස්ථාපනය කිරීමට පුද්ගලික සමාගමක් එම ක්ෂේත්‍රයේ ඔවුන්ගේ පෙර පළපුරුද්ද සලකා බැලීමෙන් තොරව තෝරාගෙන තිබූ බව නිරීක්ෂණය විය. තවද පොලි නෙට් නිවාස කිහිපයක් සඳහා භාවිතා කරන ලද ජීඅයි පයිප්ප හා වෙනත් උපාංග වැනි ද්‍රව්‍යවල ප්‍රමාණය අවශ්‍ය ප්‍රමාණයට වඩා අඩු වී තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අදාළ ගොවීන්ට භාර දී තිබූ පොලි නෙට් නිවාස 300 සඳහා සැපයුම්කරුට රු.මිලියන 3.28 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ආරුක්කු ආකාර පොලි නෙට් නිවාස 1,200 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා වෙනත් කොන්ත්‍රාත්තුවක් ව්‍යාපෘතිය විසින් ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආරුක්කු ආකාර පොලි නෙට් නිවාස ප්‍රසම්පාදනය පිළිබඳ පිරිවිතරයන් ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර නොතිබුණු බව

නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස වැඩවල විචලනයන් හා මිල ඉහළයාම් කරුණු මත රු.මිලියන 22 ක මුදලක් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු සමඟ එළඹී ගිවිසුම අනුව, මධ්‍යම පළාතේ පොලි නෙට් නිවාස සැපයීම හා සවිකිරීම සඳහා ආරුක්කු ආකාර එක් පොලි නෙට් නිවාසයකට රු.155,595 බැගින් මුදලක් වෙන් කර තිබුණි. කෙසේවුවද මාතලේ හා මහනුවර දිස්ත්‍රික්කවල පොලි නෙට් නිවාසයක් සපයා සවිකිරීමට පිළිවෙලින් රු.318,180 ක් හා රු.159,694 ක් ගෙවා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මධ්‍යම පළාතේ සවිකරන ලද පොලි නෙට් නිවාස 73 ක් සඳහා රු.242,451 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) කොන්ත්‍රාත්තුවේ දෝෂ වගකීම් කාලය තුළ උතුරු හා නැගෙනහිර පළාත්වල ඉදිකරන ලද ආරුක්කු ආකාර පොලි නෙට් නිවාස අලුත්වැඩියා කිරීමට වෙනත් පුද්ගලික සමාගමකට රු.1,761,020 ක මුදලක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) උණු කටු ඔය අමුණ ඉදිකිරීම සඳහා පිළියෙල කරන ලද ඇස්තමේන්තුව අනුව, ගියර් පෙට්ටි (Gear Box) සමඟ ජල පාලන ගේට්ටුවක් සපයා සවිකිරීම සඳහා රු.604,539 ක මුදලක් වෙන් කර තිබුණි. කෙසේවුවද එක් ගියර පෙට්ටියකට රු.244,200 බැගින් ගියර පෙට්ටි 6 ක් සපයා සවිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුට රු.1,465,200 ක මුදලක් අතිරේකව ගෙවා තිබුණි.

(ඇ) ඉංජිනේරු විසින් සකස් කරන ලද සැලසුම් ඇඳීම්වල දක්වා ඇති ගේට්ටුවල ප්‍රමාණය අවශ්‍ය ප්‍රමාණයට වඩා කුඩා වූ හෙයින් පෙරප්පන්කඩු අමුණ සඳහා සපයා සවිකරන ලද ජල පාලන ගේට්ටු සඳහා රබර් ජල ඇවිරිම් (water seal) 11 ක් සවිකිරීම සඳහා වූ අතිරේක වැඩ මත රු.623,876 ක මුදලක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි.

(ඉ) නින්දවූර්හි අල් හුඩා මාර්ගයේ පැත්තක ජලය බැස යාම් පද්ධතිය ඉදිකිරීම් සඳහා ආවරණ ස්ලැබ් (slab) 150 ක් සපයා සවිකිරීම සඳහා රු.667,500 ක මුදලක් ගෙවා තිබුණද, ආවරණ ස්ලැබ් 130 ක් පමණක් සපයා සවිකර තිබුණි. එබැවින් රු.112,120 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. තවද, ජලවහන පද්ධතියේ බිත්තියේ උස ප්‍රමාණය සමහර ස්ථානවල අඩුකර තිබීම හා ආවරණ ස්ලැබ්වල ප්‍රමාණය වර්ග මීටර 1.68 කින් අඩුකිරීම හේතුවෙන් වර්ග මීටර 51.3 ක කොන්ක්‍රීට් ස්ලැබ් එළීම සඳහා රු.739,935 ක මුළු ගෙවීම සිදු කර තිබූ හෙයින් රු.24,360 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 ජුනි 03 දින රු.මිලියන 9.54 ක මුළු පිරිවැයකට " කොම්බයින් හාවස්ටර්ස් " 03 ක් ව්‍යාපෘතිය ප්‍රසම්පාදනය කර තිබූ අතර ඉන් හාවස්ටර්ස් 02 ක් අම්පාර දිස්ත්‍රික්කයේ ග්‍රාම සංවර්ධන සංවිධානයන්ට භාර දී තිබුණි. අදාළ අධිකාරියෙන් අනුමැතිය ලබා ගැනීම වළක්වා ගැනීම සඳහා හාවස්ටර්ස් 03 ක් ප්‍රසම්පාදනය කිරීමට වෙනම මිල කැඳවීම් 03 ක් මඟින් මිල කැඳවා එක් වවුචරයකින් හාවස්ටර්ස් සඳහා ගෙවීම් කර තිබුණි. තවද සැපයීම කරන ලද දිනයේ සිට වර්ෂ 5 ක් සඳහා නොමිලයේ

අලුත්වැඩියාවන් සිදු කිරීමට සැපයුම්කරු එකඟ වී තිබුණු නමුත්, වගකීම් කාලය තුළ එම හාවස්ටර්ස් අලුත්වැඩියාවන් ග්‍රාම සංවර්ධන සංවිධානයන් විසින් ඔවුන්ගේ පිරිවැය මත සිදු කර ගෙන තිබුණි.

(ආ) අවසරයක් නොමැතිව ජලාශ ප්‍රදේශයේ පස් හැරීම මත, වන ජීවී සංරක්ෂණ ප්‍රදේශයේ ස්ථානගත මහඔය ජයවැව ජලාශය පුනරුත්ථාපන සඳහා යෙදී සිටි කොන්ත්‍රාත්කරුට එරෙහිව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නඩුවක් ගොනුකර තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) රු.22,258,620 ක පිරිවැයට පඹුරණ - සූංගාවිල මාර්ගය පුනරුත්ථාපනය කිරීම පිළිබඳව 2014 මාර්තු 17 දින සිදු කරන ලද භෞතික පරීක්ෂණයේදී මාර්ගය මතුපිට වල ගොඩැලි රාශියක් තිබූ හෙයින් ලංකාපුර ප්‍රාදේශීය සභාව විසින් මාර්ගය භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබූ බව අනාවරණය විය.